## බළන්ගොඩ නගර සභා විශේෂ මහා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.09.14

වේලාව : පෙ.ව.11.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |

**සහභාගීනොවූවෝ:-**

| | |
|---|---|
| 01. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින් , ආපදා කළමණාකරණය සඳහා පළාත් පාලන ආයතන වල කාර්යභාරය පිළිබඳ විශේෂ පුහුණු වැඩ මුළුවක් 2010 ඔක්තෝබර් 24-31 දක්වා දින 08 ක කාලයක් ඉන්දියාවේ මුම්බායි හිදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දැණුම් දී ඇති බැවින් ඒ සඳහා සභාපතිවරයා/මහජන නියෝජිතයෙකු හා කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට සහභාගීවීමට අවස්ථාව ලැබී තිබෙන නිසා , මේ සඳහා සහභාගීවන අය සම්බන්ධව සාකච්ඡාකර තීරණයක් ගෙන එය කඩිනමින් අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන නිසා, ඉතා හදිසියේම මෙම විශේෂ මහා සභා රැස්වීම කැඳවීමට සිදුවු බැව් පැහැදිලි කරන ලදී.

ගරු උපසභාපතිතුමා විදේශගතව සිටින නිසා එතුමා මේ සඳහා සහභාගී නොවන අතර ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමාට ද මේ සඳහා සහභාගිවිය නොහැකි බව දැණුම් දී ඇති බැව් සඳහන් කරන ලදී.

මෙම සංචාරය කසළ කළමනාකරණයට අදාළ වන නිසා , මේ සඳහා සහභාගීවීම ඉතා ඵලදායීවන බව පැවසීය. මෙම නගර සභාවේ කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ඇගයීමකට හා ප්‍රශංසාවට ලක්ව ඇති බැවින් , තව දුරටත් මෙය සාර්ථක කරගැනීම අපගේ අපේක්ෂාව වන අතර , ඒ සඳහා අවශ්‍ය අවශ්‍ය දැනුම උපදෙස් ලබාගැනීම සිදුකල යුතු බව දැන්වීය.

මෙම නගර සභාව දැනට ද බොහෝ පළාත් පාලන ආයතනවල නිලධාරීන් කැඳවා කසළ කළමනාකරණය සම්බන්ධව නේවාසික පුහුණු වැඩමුළු පැවැත්වීමට කටයුතු කරන අතර , ඉදිරියේ දී දිවයිනේ සියළුම පළාත් පාලන ආයතන වලට කසළ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීමට හැකිවන ආකාරයට මෙම ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරන බව දන්වමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 03. සභාවට ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම:

### 03:01 ආපදා කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතන වල කාර්යභාරය පිළිබඳ විශේෂ පුහුණු වැඩමුළුව , මුම්බායි - ඉන්දියාව

උක්ත කරුණට අදාළව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ( පුහුණු ) විසින් එවා ඇති අංක: SLILG හා 2010.09.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ආපදා කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතනවල කාර්යභාරය පිළිබඳ විශේෂ පුහුණු වැඩමුළුවක් සමස්ථ ඉන්දීය පළාත් පාලන පුහුණු ආයතනය , මුම්බාහිදී 2010 ඔක්තෝබර් 24-31 දක්වා දින 08 ක කාලයක් පැවැත්වීමට නියමිත අතර , මේ සඳහා එක් පළාත් පාලන ආයතනයකින් තිදෙනෙකුට( සභාපතිතුමා,මහජන නියෝජිතයෙකු හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිලධාරීන් 01 අයෙකු ) සහභාගිවිය හැකි බවත් , එක් අයෙකුට රු.130,000/- ක(පාඨමාලා ගාස්තු,ආහාර,නවාතැන්,ක්ෂේත්‍ර චාරිකා,ගුවන් ටිකට්පත් ආදි සියළු දෑ සඳහා ) මුදලක් ගෙවිය යුතු වන අතර , ඒ සඳහා විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010 සැප්තැම්බර් මස 30 දිනට ප්‍රථම ලැබීමට සලස්වන ලෙසත් , වැය වන සම්පූර්ණ මුදල අධ්‍යක්ෂ පළාත් පාලන ආයතනය නමින් ලියන ලද චෙක්පතක් මගින් එවීමට කටයුතු කරන ලෙසත් එමගින් දන්වා ඇත.

මෙම පුහුණු වැඩමුළුව සඳහා මෙම නගර සභාවේ ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා,ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා හා ලේකම්,ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා සහභාගීවීම සුදුසු වන අතර , මේ සඳහා වැය වන සියළු වියදම් සභා අරමුදලින් දැරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනාව සභා සම්මත විය.

### 03:02 ජංගම ගිණුම් අතර මුදල් මාරුකිරීම සඳහා අනුමැතිය ලබාගැනීම

බළන්ගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යන අංක:017-1-001-0-6351750 දරණ ජංගම ගිණුමට අත්‍යාවශ්‍ය ගෙවීම් කටයුතු කිරීම සඳහා අංක:0005947660 දරණ ලංකා බැංකුවේ ජංගම ගිණුමෙන් රු.2,000,000/- මාරුකිරීමට අනුමැතිය සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

- මග නැගුම ව්‍යාපෘතිය යටතේ මහ මෙව්නා මාවතේ සිට නාවලඇල්ල මහතාගේ නිවස මාර්ගය සංවර්ධනය කිරීමේ දී මාර්ගය හරහා යොදා තිබු ජලනල පද්ධතිය වෙනස් කර ඇති බැවින් , නැවත එම ජලනල පද්ධතිය සකස් කිරීම සඳහා අගල් 01 බට 300 ක් ලබාදෙන ලෙස ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් ඉල්ලීමක් කර ඇති බැව් ගරු සභාපතිතුමා විසින් දැන්විය.

අවශ්‍ය බට ප්‍රමාණය ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

04. **මිළ ගණන් ඉදිරිපත් කිරීම** :

04:01 **බළන්ගොඩ තානායම සඳහා අවශ්‍ය උපකරණ ලබාගැනීම :**

| වර්ගය | නිපුණ ෆර්නිචර්ස් | රුෂිනි ෆර්නිචර්ස් | මනීෂ ෆර්නිචර්ස් | දම්රෝ ඩී.ආර්.ඉන්ඩස්ට්‍රීස් පු.ලි. |
|---|---|---|---|---|
| ඇඳි පුටු ( ෆැබ්රික් ) | 4750/- | 4500/- | 4800/- | **4165/-** |
| ඇඳි පුටු (ඩබල් ගෑස් ස්ටීල් | 13400/- | 13000/- | 12500/- | **11650/-** |
| 75"x72"x4" මෙට්ට ( ඩබල් ලේයර් ) | 13550/- | 13100/- | 13400/- | **12935/-** |

අවම මිළ ඉදිරිපත් කරඇති දම්රෝ ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙතින් අවශ්‍ය උපකරණ ලබාගැනීමේ සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

04:02 **බළන්ගොඩ නගර සභා තානායම සඳහා සේප්පුවක් ලබාගැනීම:**

| වර්ගය | ඔයිල් මාර්කට්න් පු.ලි.කොළඹ | සිතාරා ෆර්නිචස් රත්නපුර | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් කොළඹ. |
|---|---|---|---|
| සේප්පු 01 | 31750.00 ( මධ්‍යම ප්‍රමාණයේ ) | 31500.00( කුඩා මාදිළියේ ) | 29008.00 |

ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් ආයතනය අවම මිළ ඉදිරිපත් කර ඇති බැවින් , එම මිළ ගණන පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

04:03 **තාර බැරල් 20 ක් ලබාගැනීම**

මාර්ග අලුත්වැඩියාවන් සඳහා තවත් තාර බැරල් 20 ලබාගැනීම අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර, ඒ සඳහා ද අනුමැතිය ලබාදෙන ලදී.

**05. අවසානයඃ-**

ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ

අද දින විශේෂ මහා සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු පෙ.ව. 12.30 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.